**හාලිඇල ප්‍රාදේශීය සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**

---

## 1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

### 1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 27 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 29 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජුලි 22 දිනද ,සභාපතිවරයාට යවා ඇත.

### 1.2 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට හාලිඇල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 <u>තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම</u>

**(අ) <u>ගිණුම්කරණ අඩුපාඩු</u>**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුමේ ශේෂය රු.6,806,185 ක් ලෙස ලෙජර් ගිණුමේ දක්වා තිබුණද, මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබුණු උපලේඛන අනුව එය රු.1,850,884 ක් විය. | ගිණුම් සසඳා නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | ඉකුත් වර්ෂ වල සිට පැවත එන අසාමනකමක් බැවින් නිවැරදි කිරීමට කටයුතු කරමින් පවති. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ මුද්දර ගාස්තු ආදායම රු.22,935,662 ක් වුවද,එය මූල්‍ය ප්‍රකාශන වල රු.24,000,000 ක් ලෙසට දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කර ඇත. |

**(ආ) <u>නොසැසඳුනු ගිණුම්</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගිණුම් විෂයයන් 03 කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය හා උපලේඛන අනුව ශේෂය අතර රු.37,232,820 ක වෙනසක් පැවතුනි. | ගිණුම් සසඳා නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | ගිණුම් විෂයන් 03 ට අදාල ගිණුමේ ශේෂය නිවැරදි කිරීමට කටයුතු කරමි. |

(ඇ) <u>විගණනය සඳහා සාක්ෂි නොවීම.</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.103,446,259 ක ගිණුම් විෂයයන් 04 ක් සඳහා ස්ථාවර වත්කම් ලේඛනය, ඔප්පු, බලපත්‍ර, උපලේඛන සහ කාල විශ්ලේෂණ වාර්තා විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | ලේඛන යාවත්කාලීන කරමින් පවති. |

1.4 <u>අනුකූල නොවීම්</u>

<u>නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම</u>

| | නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | <u>1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනත</u> 19(XI) වගන්තිය හා 173, 174 වගන්ති | සභාවට අයත් ඉඩම් 03 ක් අමාත්‍යවරයාගේ අනුමැතියකින් හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය නොකර බාහිර පාර්ශවයන් 03 ක් වෙත දිගුකාලීනව බදු දී තිබුණි. | අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගත යුතු අතර, ප්‍රසම්පාදන අනුගමනය කළ යුතුවේ. | ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබාගැනීම සඳහා ලිපිලේඛන ඉදිරිපත් කර ඇත. |
| (ආ) | <u>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි</u> මුදල් රෙගුලාසි 371 | අවස්ථා 03 ක දී දෙන ලද එකතුව රු 217,718 ක අතුරු අග්‍රිම වර්ෂ 07 ක කාලයක් ගතවී ඇතත්, පියවා නොතිබුණි. | අතුරු අග්‍රිම පියවා ගත යුතුවේ. | අතුරු අග්‍රිම පියවා ගැනීමට කටයුතු කරමි. |

## 2. <u>මූල්‍ය සමාලෝචනය</u>

### 2.1 <u>මූල්‍ය ප්‍රතිඵලය</u>

ඉදිරිපත් කරනලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.16,277,597 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.7,687,228 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිග ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2019 ඇස්තමේන්තු ගත ආදායම | 2019 බිල්කළ ආදායම | 2019 රැස්කළ ආදායම | 2019 දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම | 2018 ඇස්තමේන්තුගත ආදායම | 2018 බිල්කළ ආදායම | 2018 රැස්කළ ආදායම | 2018 දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 2,668,568 | 2,000,494 | 1,434,922 | 565,574 | 2,665,364 | 2,000,494 | 1,311,093 | 689,401 |
| (ii) | බලපත්‍ර ගාස්තු | 1,465,000 | 1,465,000 | 2,145,425 | - | 1,415,000 | - | 1,640,810 | - |
| (iii) | වෙනත් ආදායම් | 3,001,352 | 30,418,817 | 288,424 | 161,383 | 30,624,971 | 3,041,806 | 232,887 | 2,808,919 |
| | එකතුව | 7,134,920 | 33,884,311 | 3,868,771 | 726,957 | 34,705,335 | 5,042,300 | 3,184,790 | 3,498,320 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වසර පහකට අධික කාලයක සිට අය නොවී පවතින හිඟහිටි ආදායම් රු. 83,825,056 ක් අය කරගෙන නොතිබුණි. | ලැබිය යුතු ආදායම් අය කරගත යුතුවේ. | මෙම ගිණුම් ශේෂයන් අය කිරීමට කටයුතු කරමින් පවතී. |

### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ උසාවි දඩ රු.23,000,000 ක් සහ මුද්දර ගාස්තු රු.4,861,609 ක් අය කරගෙන නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගත යුතුවේ. | අය කර ගැනිමට කටයුතු කරමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව එක්සත් ජාතීන්ගේ "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" පිළිබඳව දැනුවත්වී නොතිබුණු අතර සභාවට අදාල කරගත හැකි තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්කද හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනාගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ළඟාකර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනා ගැනීමට කටයුතු කර ඇත. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභාවේ රථගාලේ පැති බැම්ම ඉදිකිරීම වෙනුවෙන් 2019 ජූලි 08 දින රු.1,901,470 ක මුදලකට ගොවි සමිතියක් සමඟ ගිවිසුමකට එළඹ අත්තිකාරම් ලෙස රු.380,294 ක් ගෙවා තිබුණි. 2019 අගෝස්තු මස 06 දින වනවිටත් කර්මාන්තයට අදාලව කිසිදු කාර්යක් ඉටු කර හෝ කර්මාන්තයට අවශ්‍ය භාණ්ඩ එකී වැඩ බිමට ගෙනවිත් නොතිබුණි. | ගිවිසුම අනුව නියමිත දිනට වැඩ අවසන් කළ යුතුවේ. | ඉදිකිරීම් සිදුකිරීමේදි ඉඩම සම්බන්ධයෙන් ඇති වූ ගැටළුකාරී තත්ත්වය හේතුවෙන් මැනුම් කිරීමෙන් පසු නැවත ඉදිකිරීම් සිදු කරමි. |
| (ආ) | ඉකුත් වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන වල ස්ථාවර වත්කම්, ඉඩම් හා ගොඩනැඟිලි යටතේ ඇතුලත් කර තිබුණු රු.100,000 ක ගිණුම් ශේෂය කිසිදු අනුමැතියකින් තොරව ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලින් ඉවත් කර තිබුණි. | ස්ථාවර වත්කම් කපා හැරීමේදි නියමිත ක්‍රමවේද අනුගමනය කළ යුතුවේ. | පසුගිය වර්ෂයේ විගණන වාර්තාව අනුව කපා හැර ඇත. |
| (ඇ) | වසර පහකට අධික කාලයක සිට පැවත එන ගෙවිය යුතු වියදම් හා කර්මාන්ත ණය හිමි රු.52,607,778 ක් නිරවුල් කර නොතිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කළ යුතුවේ. | මෙම ගිණුම් ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කරමි. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේනිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු 13 කට අදාලව පුරප්පාඩු 28 ක් පැවතුනි. | අත්‍යාවශ්‍ය පුරප්පාඩු පුරවා ගත යුතුවේ. | පුරප්පාඩු සඳහා ඉල්ලුම් කර ඇත. |

**4. ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය**

**4.1 විගණන හා කළමනාකරණ කමිටු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 02ක් පමණක් පවත්වා තිබුණි. | කාර්තුවකට එක් වරක් වන පරිදි විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය යුතුවේ. | ඉදිරි වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට කටයුතු කරමි. |

**4.2 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | අභ්‍යන්තර විගණනයක් සිදුකළ යුතුවේ. | ඉදිරි වර්ෂයේදී අභ්‍යන්තර විගණනයක් සිදු කරමි. |